# දුෂ්ප්‍රාඥයෝ ප්‍රඥා කථා ඇසෙන විට ගැටෙති කෝපවෙති විරුද්ධ වෙති අසතුට පළ කරති

## දුක්කථා සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 294 - 299)

දුෂ්ප්‍රාඥයා (අනුවණයා, මෝඩයා) ප්‍රඥා කථාව ඇසෙන විට ම කෝපයට පත්වෙයි. කිපෙයි. ව්‍යාපාදයට පැමිණෙයි. විරුද්ධ ව නැගී සිටියි. කෝපය, ද්වේෂය හා අසතුට පහළ කරයි.

ඒ කවර හෙයින් ද යත්;

තමා තුළ ඒ ප්‍රඥාව නොදකී. ඒ නිසා ප්‍රීති ප්‍රමෝදය නොලබයි.

එ හෙයින් දුෂ්ප්‍රාඥයාට ප්‍රඥා කථා දුක් කථාය.